# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

## ප්‍රතිඵල නැවත සමීක්ෂණය

## අයදුම්පත් මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. උක්ත විභාගයේ නැවත සමීක්ෂණ අයදුම්පත් මාර්ගගත ක්‍රමයට පමණක් කැඳවනු ලැබේ.
2. අයදුම්පත් භාරගැනීම 2022-12-08 දින සිට 2022-12-20 දින දක්වා සිදුකරනු ලැබේ.
3. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීම පහත ක්‍රම ඔස්සේ සිදු කළ හැකිය.
   - ❖ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (https://www.doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත Click කර ඉන් පසු "Application for Re-Scrutiny of results" වෙත පිවිසීම මගින්
   - ❖ විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම් (Mobile Application) වන DoE වෙත පිවිස "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත Click කර ඉන් පසු "Application for Re-Scrutiny of results" වෙත පිවිසීම මගින්
   - ❖ https://onlineexams.gov.lk/eic වෙත පිවිසීම මගින්
4. පද්ධතියට පිවිසීමේදී ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය හා ඔබ අ.පො.ස. (සා.පෙළ) - 2021 (2022) විභාගය සඳහා පෙනී සිටි විභාග අංකයම භාවිත කළ යුතුය.
5. අයදුම්පත් සම්පූර්ණ කිරීමට ප්‍රථම තාක්ෂණික උපදෙස් (Technical Instructions), පොදු උපදෙස් (Common Instructions) කියවීම සහ උපදෙස් වීඩියෝව නැරඹීම, නිවැරදි ආකාරයට අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.
6. එක් විෂයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 200/- කි. Credit කාඩ් / Debit කාඩ් මගින් හෝ තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කළ හැකිය.
7. මුදල් ගෙවීමෙන් පසු අයදුම්පත PDF ක්‍රමයට බාගත (Download) කර ගත හැකි අතර, එම අයදුම්පත ඔබ භාරයේ තබා ගත යුතුය. එසේම මුදල් ගෙවීමෙන් පසු ඔබගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක්ද ලැබෙනු ඇත.
8. නැවත සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය සියලුම විෂයන් සහිතව නිවැරදිව අයදුම්පත සම්පූර්ණ කිරීම අයදුම්කරුගේ වගකීම වන අතර, නියමිත ගාස්තුව ගෙවා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත් සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
9. මේ සම්බන්ධයෙන් යම් විමසීමක් අවශ්‍ය වේ නම් පහත සඳහන් දුරකථන අංක මගින් විමසීම් කළ හැකිය.

| | |
|---|---|
| පාසල් විභාග ඇගයීම් ශාඛාව | - 011-2785231 / 011-2785216 / 011-2784037 |
| ක්ෂණික ඇමතුම් අංකය | - 1911 |

**එල්.එම්.ඩී. ධර්මසේන**
**විභාග කොමසාරිස් ජනරාල්**